# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කොමිෂන් සභා ලේකම්

**රැකියා විස්තරය**

01. කොමිෂන් සභා රැස්වීම් කැඳවීම
02. රැස්වීම්වල වාතර්ා සහ අදාළ ලියකියවිලි පවත්වාගෙන යාම
03. කොමිෂන් සභාවේ තීරණ දැනුම් දීම සහ පසු විපරම් ක්‍රියාමාගර් ගැනීම
04. වාෂර්ික වාතර්ා සම්පාදනය කිරීම
05. ප්‍රසිද්ධ විභාග පටිපාටි වලට සහභාගී වීම

**අවශ්‍ය අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්:**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් 1 වන හෝ 2 වන පන්තියේ නීති (විශේෂ) උපාධිය ලබා තිබීම

**හෝ**

නීතිඥවරයෙකු විය යුතු වීම

**සහ**

**අවශ්‍ය පළපුරුද්ද :**

නීති ක්ෂේත්‍රය පිළිබඳව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 03ක පශ්චාත් - සේවා සුදුසුකම්

**හෝ**

දීප ව්‍යාප්ත සේවයේ නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා පළපුරුද්ද සපුරා තිබීම

**අවශ්‍ය වෙනත් සුදුසුකම්:**

කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පරිදි, දත්ත සමුදා කළමනාකරණය සහ සම්මත මෘදුකාංග පැකේජ පිළිබඳව මනා දැනුම

**සහ**

කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පරිදි, ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ භාෂා හැසිරවීමේ (ලිඛිත සහ වාචික) විශිෂ්ට සන්නිවේදන කුසලතාවය

**වයස:** අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනට වයස අවුරුදු 22 නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප :** - TRC - 2-2 වැටුප් පරිමාණය අදාළ වේ

බඳවා ගැනීමේ පටිපාටිය – තරඟකාරී ලිඛිත විභාගයකින් පසුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි

ලිඛිත විභාගය සඳහා විෂයයන් - සාමාන්‍ය බුද්ධිය, විෂයය දැනුම, කළමනාකරණ කුසලතා

**අයදුම්කරන ක්‍රමය**

- අයදුම්පත්‍රය මෙතැනින් බාගත කළ යුතුය.
- අදාළ ආකෘතියට අනුකූල නොවන පරිදි පිළියෙල කර එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සම්පූණර් කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමග එවිය යුතුය.
- අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර අවශ්‍යතාවයනට අනුකූල නොවන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූණර් විස්තර සහිතව සකස් කරන ලද අයදුම්පත්‍රවල PDF පිටපත් 2022.03.23 දින හෝ එදිනට පෙර careers@trc.gov.lk විද්‍යුත් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. දැනටමත් රජයේ දෙපාතර්මේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්හී සේවයේ නියුතු අයදුම්කරුවන් වතර්මාන තනතුරෙන් නිදහස් කිරීමට එකඟතාවය සහිතව අදාළ දෙපාතර්මේන්තු / ආයතන ප්‍රධානියා මගින් ඉහත තනතුරු සඳහා සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- සහතික පිටපත් නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම සියලුම ලියකියවිලි වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

**පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
4. බඳවා ගැනීම කල්දැමීම/අවලංගු කිරීම තීරණය කිරීම පිළිබඳ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුය.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යනු නියාමන අධිකාරියක් වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රැකියාව සඳහා බඳවා ගන්නා ඕනෑම පුද්ගලයෙකු ඔහුගේ/ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියාමන පාලනය යටතේ පවතින ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක් ලබා ගැනීම සඳහා සෘජුව හෝ වක්‍රව දිරි ගැන්වීම, මැදිහත්වීම හෝ පෙනී සිටීම සිදු නොකළ යුතුය.
6. දැනටමත් රජයේ දෙපාතර්මේන්තු , සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වුවන් තෝරාගනු ලැබුවහොත් දැනට නිරත තනතුරින් නිදහස් කිරීමේ හැකියාව සඳහන් කරමින් අදාළ ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.